23-3-1992

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 705 – 1992 මාර්තු 06 වැනි සිකුරාදා – 1992.03.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස–පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | – | තනතුරු – ඇබෑර්තු ... ... | – |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | – | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 626 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | – | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | – |
| පළාත් සභා නිවේදන ... ... | 596 | බඩුබාහිරාදිය විකිණීම් ... ... | – |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | – | කොටුපල්, ජේත්ද හා වෙනත් ජේත්ද විකිණීම් ... | – |
| | | විවිධ දැන්වීම් ... ... | – |


සැ. යු. (i) විසර්ජන පනත් කෙටුම්පත, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත් කෙටුම්පත, සහ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත, 1991 සැප්තැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) උක් පර්යේෂණ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත, 1991 සැප්තැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා වෛද්‍ය නීති සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත සහ ශ්‍රී බෝධිරාජ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 1991 ඔක්තෝබර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1991 අංක 29 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත, සහ 1991 අංක 30 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත 1991 අගෝස්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(v) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1991 අංක 31 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත, 1991 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව– එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1992 මාර්තු මස 13 වන දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1992 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1991 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

593–B 076086–7,807 (92/02)

F 1- B 076086

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1990 අංක 08 දරනු. ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1990 නොවැම්බර් මස 15 වැනි දින.

අනුමැතිය ලැබුණේ : 1991 ජනවාරි මස 23 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස්. ඩී. පියදස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### 1990 අංක 08 දරන සබරගමුව පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය

*සබරගමු පළාත තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීමට විධි විධාන යෙදීම පිණිසත්, එසේ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අය කිරීම පිණිසත්, ඒ හා සම්බන්ධ වූ වෙනත් කටයුතු පිණිසත් පනවන ලද ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය (149 වැනි අධිකාරය වූ) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතට අනනුකූල වූවකි.*

සබරගමු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මේ ප්‍රඥප්තිය 1990 අංක 08 දරන සබරගමු පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1991.01.01 වැනි දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

ප්‍රඥප්තිය යටතේ පරිපාලනය.

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කරනු ලැබිය යුතුය. මේ ප්‍රඥප්තිය යටතේ සාමාන්‍ය පරිපාලනය ඔහුට භාරවන අතර, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන, පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් සහ වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය යම් පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයකු විසින් හෝ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකිය. ඉටු කරනු ලැබිය හැකිය. සිදු කරනු ලැබිය හැකිය.

ව්‍යාපාර නාම ලියාපදිංචිය.

3. (1) මෙහි 2 වන උප වගන්තියට යටත් වූ ද මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද සහතිකය බලය යටතේ ද හැර මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනයේ දී හෝ ඉන් පසු සබරගමු පළාත තුළ ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් පත්වාගෙන නොයා යුතුය.

(2) (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනත යටතේ සබරගමු පළාත තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සඳහා දැනටමත් නිකුත් කරන ලද්දා වූ සහතික පත්‍රයක් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතික පත්‍රයක් ලෙස සළකනු ලැබිය යුතු අතර මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස 06ක කාලයක් සඳහා පමණක් එම සහතික පත්‍රය වලංගු වන්නේය.

(3) ඉහත (1) උප වගන්තියේ සඳහන් ලියාපදිංචි කිරීමේ සහතික මෙම ප්‍රඥප්තියේ දින සිට මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව නියමිත ගාස්තු ගෙවා ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කරවාගෙන අදාළ ලියාපදිංචි කිරීමේ සහතික පත් ලබාගත යුතුය.

(4) සබරගමු පළාතේ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇත්තා වූ ද, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද වලංගු සහතිකයක් නොමැතිව ව්‍යාපාරික නාමයක් යටතේ ව්‍යාපාරය කරගෙන යන්නා වූ ද, යම් ව්‍යාපාරික ආයතනයක් හෝ තැනැත්තකු, මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මගින් ඒකාබද්ධ කරන ලද (149 වැනි අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනතේ විධිවිධාන සලස්වා ඇති දණ්ඩනවලට යටත් විය යුතුය.

ඒකාබද්ධ කිරීමේ.

4. (1) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද (149 වැනි අධිකාරය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ 2 සිට 16 දක්වා වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළුව) සහ 18 සිට 20 දක්වා (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල විධිවිධාන එකී වගන්තිවල "ආඥාපනත" යන වචනය යෙදී ඇති කවර වූවද තැනක ඒ වෙනුවට "ප්‍රඥප්තිය" යන වචනය ආදේශ කිරීමට යටත්ව සහ එකී ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ 8 වන ඡේදයේ "රුපියල් සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමට යටත්ව සහ එම ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ 10 වන ඡේදයේ "රුපියල් තුන්සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමට යටත්ව මේ ප්‍රඥප්තියෙහි ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා මේ ප්‍රඥප්තියෙහි කොටසක් වන්නේය. තවද එකී වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සබරගමුව පළාත තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා අදාළ වන්නේය.

(2) මෙහි 1 වන තීරයෙහි දැක්වෙන යම් නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දෙයකට අදාළව (1) වන උප වගන්තියේ සඳහන් විධි විධානවලට ඇතුළත් වන යම් සඳහනක් මෙහි 2 වන තීරයේ තදානුරූපව දක්වා ඇති නිලධරයකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දෙකයට කරනු ලැබූ සඳහනක් සේ සලකනු ලැබිය යුතුය.

| 1 වැනි තීරය | 2 වැනි තීරය |
| --- | --- |
| අමාත්‍යවරයා | සබරගමුව පළාතේ වෙළඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා |
| රෙජිස්ට්‍රාර් | පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් |
| මේ ආඥාපනත | මේ ප්‍රඥප්තිය |

5. (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනතේ විධි විධාන අදළ වන බවට මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇත්තේ යයි සලකනු ලබන තාක් දුරට හැර, එකී ආඥාපනතේ විධිවිධාන, ව්‍යාපාරික නාම යටතේ සබරගමු පළාත තුළ ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාරික ආයතන සහ තැනැත්තන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සහ ඊට සම්බන්ධ කාර්ය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම නතර විය යුතුය. (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥාපනත සබරගමු පළාත තුළ අදළ නොවන බව.

6. (1) පහත දැක්වෙන කවර කරුණක් සඳහා වුව ද ව්‍යවස්ථා හෝ නියෝග සබරගමු පළාතේ වෙළඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් සම්පාදනය කළ හැකිය :– නියෝග සම්පාදනය.

(අ) පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු හා පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම හා මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ලියාපදිංචි කිරීමේ කාර්යාල පිහිටුවීම;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රුපියල් පන්සියයකට වැඩි නොවන පරිද්දෙන් පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්ට හෝ පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවියයුතු ගාස්තු;

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ පාවිච්චි කළ යුතු ආකෘති;

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් හා පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ඉටු කළ යුතු යුතුකම්;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් විසින් කළ යුතු බවට නියම වූ කාර්ය භාරය පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් හා සෙසු නිලධාරීන් විසින් ඉටු කිරීම;

(ඊ) මෙම ප්‍රඥප්තිය යටතේ තබනු ලබන ලේඛන හෝ ඒවායේ අන්තර්ගත විස්තර පිළිබඳ වාර්තාවන්හි විස්තර ගැසට් පත්‍රයෙන් හෝ වෙනත් ක්‍රමයකින් කලින් කල, ප්‍රසිද්ධියට පත් කිරීම;

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය පරිපාටියට හා පාලනය සහ ඊට ආගන්තුක වූ සෙසු කරුණු ද වේ.

(2) එබඳු කිසියම් ව්‍යවස්ථා හෝ ආඥා සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ගාස්තු සබරගමුව පළාතේ වෙළඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් විධාන කරන පරිද්දෙන් ගෙවිය යුතුය.

03–55/2

---

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 03 දරන පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩලය) ප්‍රඥප්තිය

ගැසට් කය සටහන් කළේ : 1991 අප්‍රේල් මස 18 වැනි දින.

අනුමැතිය ලැබුණේ : 1991 මැයි මස 07 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදියි,

ඇස්. ඩී. පියදස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### සබරගමු පළාතේ 1991 අංක 03 දරන පළාත් පාලන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

*පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන් පළාත් පාලන ආයතනවලට ලබා දීමට හැකියාව සඳහාත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මේ ප්‍රඥප්තිය 1980 අංක 36, 1985 අංක 10 සහ 1987 අංක 16 දරන පනත්වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන පනතට අනුකූල වේ.

1. මේ ප්‍රඥප්තිය සබරගමු පළාතේ 1991 අංක 03 දරන පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයා ගේ අනුමතය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය.

පළාත් පාලන සේවයේ සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීම.

2. (1) (අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු, ඔහුගේ කැමැත්ත ඇතිව සහ පළාත් පාලන කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයකට පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව හෝ එවැනිම කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකිය.

(ආ) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව පත් කරනු ලැබූ විට කලින් කල සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20අ වැනි වගන්තියේ (2) සහ (3) වැනි උප වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව එකී සාමාජිකයන්ට අදාල විය යුතුය.

(2) (අ) පළාත් පාලන සේවයේ සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී කලින් කල සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20අ වැනි වගන්තියේ (4) උප වගන්තියේ විධිවිධාන අදාල වෙනස් කිරීම් සහිතව ඒ සාමාජිකයාට අදාළ විය යුතුය.

(ආ) එවැනි සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ දින සිට පළාත් පාලන සේවය අත්හැර ගිය තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඔහු එසේ පත් කරන ලද අවස්ථාවේ දී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු වූයේ නම් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල නියමයන් ප්‍රකාර ප්‍රදානයන් ලැබීමට ඔහුට හිමිකම ඇත්තේය.

එසේ වුවද, එකී ප්‍රදානය ඔහුට ගෙවනු ලැබිය යුත්තේ පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවා නියුක්තිය අවසාන වීමෙන් පසුව පමණකි.

(ඇ) ඉහත (2) 1 (අ) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු එසේ පත් කරන ලද අවස්ථාවේ දී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකුව සිටියේ නම්, පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවය, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා විශ්‍රාම වැටුප් හිමි සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ සාමාජිකයකු පිළිබඳ විනය පාලනය සහ පත් කිරීම, ඔහුගේ ස්ථානමාරු, විශ්‍රාම ගැනීම ආදිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු බව.

3. පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් මුදා හැරීම, විශ්‍රාම ගැන්වීම, ඔහුගේ තනතුර අහෝසි කිරීම, ඔහු ධුරයෙන් අස් කිරීම සහ ඔහු පිළිබඳ විනය පාලනය, ඒ සාමාජිකයා පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තියෙහි යෙදී සිටින තාක් කල් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

එසේ වුවද එවැන්නකු පිළිබඳ විනය පාලන කටයුතු ඉහත සඳහන් පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්ති යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව විය යුතුය.

4. (1) පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ නිලධරයකුගේ සේවය පළාත තුල පිහිටි යම් පළාත් පාලන ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන කාල පරිච්ඡේදයකට එවැනි පළාත් පාලන ආයතනයකට ලබා දිය හැකිය යන්න එසේ පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලබන සෑම නිලධරයකු සම්බන්ධයෙන්ම වූ නියමයක් සහ කොන්දේසියක් වන්නේය.

(2) ඉහත I වැනි උපවගන්තිය යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකුගේ සේවය පළාත් පාලන ආයතනයට ලබා දුන් අවස්ථාවක දී පළාත් රාජ්‍ය සේවයේ වෙනත් යම් නිලධරයකුට අදාළ වන විනය පාලනයටම ඔහු යටත් වන්නේය.

03–55/6

---

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1991 අප්‍රේල් මස 18 වැනි දින.

අනුමැතිය ලැබුණේ : 1991 මැයි මස 07 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස්. ඩී. පියදස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### 1991 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය

*1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ IV වන සහ V වන උපලේඛනවල විස්තර වන ප්‍රාදේශීය සභාවලට විශේෂ කොමසාරිස්වරු පත් කිරීමට විධි විධාන සලස්වන සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු ඇතුළත් ප්‍රඥප්තිය.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබිය යුතුය.

1. මෙම ප්‍රඥප්තිය 1991 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. *කෙටි නාමය.*

2. (1) 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ IV වන හෝ V වන උපලේඛනවලින් විස්තර වන පරිදි, වෙනත් නීතියක ඊට පටහැනි කිසිවක් නොතකා, අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය පවරා ඇති අමාත්‍යවරයාට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් එනැම ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය කිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයෙකු පත් කළ හැකිය. *විශේෂ කොමසාරිස්වරයෙකු පත් කිරීම.*

(2) (1) වන උප වගන්තියේ සඳහන් විශේෂ කොමසාරිස්වරයා ප්‍රාදේශීය සභා කාර්යාලය පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා විය යුතුය.

(3) (1) වන උප වගන්තියේ සඳහන් විශේෂ කොමසාරිස්වරයෙකු පත් කිරීම, නියෝගයෙන් වෙනත් ආකාරයකට සඳහන් නොවන්නේ නම්, (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභාවට සභිකයින් තේරීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන තෙක්, බලාත්මක වන්නේය.

(4) (1) වන උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක විශේෂ කොමසාරිස් ලෙස පත් කරනු ලැබූ අයෙකුගේ ප්‍රාදේශීය ලේකම් ලෙස හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස නිත්‍ය තනතුර, නිලධරයාගේ මරණයෙන්, ඉල්ලා අස්වීමෙන්, සේවයෙන් පහ කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් හිස් වුවහොත්, එවැනි ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය කිරීම සඳහා, ඔහුගේ අනුප්‍රාප්තිකයෙකු අමාත්‍යවරයාට පත් කළ හැකිය.

3. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සහ වෙනත් නීතියක් අතරේ ගැටීමක් හෝ පරස්පරයක් ඇති වූ අවස්ථාවක මෙම ප්‍රඥප්තියේ විධිවිධාන එම නීතියේ විධිවිධාන අභිබවා බලාත්මක වනු ඇත. *වෙනත් නීතියක් සමඟ ගැටීමක් හෝ පරස්පරයක් ඇති වූ විට.*

03-55/7

---

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1990 අංක 10 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1990 දෙසැම්බර් මස 06 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1990 දෙසැම්බර් මස 28 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස්. ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### සබරගමුව පළාත් සභාවේ 1990 අංක 10 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

*1990 අංක 2 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තිය.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 1990 අංක 10 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. 1990 අංක 2 දරන විසර්ජන ප්‍රඥප්තියේ 02 වන වගන්තියේ 1 වන උප වගන්තියේ සඳහන් "රුපියල් එකසිය තිස් කෝටි අසූහත් ලක්ෂ අනූ දෙදහස් එකසිය තිහක්" යන වචන වෙනුවට "රුපියල් එකසිය හැත්තෑ තුන්කෝටි හතලිස් හතර ලක්ෂ අනූහත්දහස් තිහක්" යන වචනයට ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

03. 1990 අංක 2 දරන විසර්ජන ප්‍රඥප්තියේ දෙවන වගන්තියේ 1වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් "රුපියල් එකසිය තිස් කෝටි අසූහත් ලක්ෂ අනූ දෙදහස් එකසිය තිහක්" යන වචන වෙනුවට "රුපියල් එකසිය හැත්තෑ තුන් කෝටි හතලිස් හතර ලක්ෂ අනූහත් දහස් තිහක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

04. 1990 අංක 2 දරන විසර්ජන ප්‍රඥප්තියේ පළමු වැනි උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ.

**පළමුවැනි උපලේඛනය**

*පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්*

| | | රු. |
|---|---|---|
| ශීර්ෂ 10 සිට 80 දක්වා | - | |
| පුනරාවර්තන වියදම් | - | 1,422,632,000 |
| ප්‍රාග්ධන වියදම් | - | 311,865,030 |
| එකතුව | - | 1,734,497,030 |

29

| | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| ශීර්ෂ 10 : ගරු ආණ්ඩුකාරතුමා– | | |
| වැඩ සටහන 1 – සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා ලෙස බලතල ක්‍රියාත්මක කිරීම | 1,339,000 | 2,450,000 |
| ශීර්ෂ 20 : පළාත් සභා සභාපති– | | |
| වැඩ සටහන 1 – පළාත්.. සභා සේවා | 5,061,420 | 300,000 |
| ශීර්ෂ 30 : ප්‍රධාන අමාත්‍යවරයා – | | |
| වැඩ සටහන 1 – ප්‍රධාන ලේකම් කාර්යාල කටයුතු මගින් බලතල ක්‍රියාවේ යෙදවීම | 14.913,329 | 113,764,030 |
| වැඩ සටහන 2 – ප්‍රධාන අමාත්‍යාංශ කටයුතු මගින් බලතල ක්‍රියාවේ යෙදවීම | 5,177,320 | 60,250,000 |
| ශීර්ෂ 40 : අධ්‍යාපන අමාත්‍යවරයා | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 36,836,820 | 5,000,000 |
| ශීර්ෂ 41 : අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 6,276,557 | 14,320,000 |
| වැඩ සටහන 2 – සාමාන්‍ය අධ්‍යාපනය | 576,182,443 | 52,180,000 |
| ශීර්ෂ 43 : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 7,848,723 | 2,200,000 |
| වැඩ සටහන 2 – රෝගීන් රැක බලා ගැනීමේ සේවය | 187,492,692 | 28,310,000 |
| වැඩ සටහන 3 – ප්‍රජා –සෞඛ්‍ය සේවය | 23,810,585 | 2,900,000 |
| ශීර්ෂ 44 : ආයුර්වේද දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 –ආයුර්වේදීය සේවා | 11,215,000 | 1,810,000 |
| ශීර්ෂ 50 : කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා – | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය | 3,599,800 | 5,000,000 |
| ශීර්ෂ 51 : ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – ඉඩම් පරිපාලනය සංවර්ධනය ආඥාපනත් යටතේ ඉඩම් බෙදා දීම හා දීමනා පත්‍ර නිකුත් කිරීම | 3,300,000 | – |
| ශීර්ෂ 52 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – බෝග පාලනය හා සංවර්ධනය | 9,560,000 | – |
| ශීර්ෂ 53 : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – අපනයන බෝග ව්‍යාප්තිය හා සංවර්ධනය කිරීම | 850,000 | 1,300,000 |
| ශීර්ෂ 54 : ගොවිජන සේවා දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | 2,063,300 | 700,000 |
| වැඩ සටහන 2 – කෘෂිකාර්මික නිෂ්පාදනය නංවාලීම, ගොවිජන– කළමණාකරනය හා සේවාවන් | 3,214,700 | 3,356,000 |
| ශීර්ෂ 55 : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – සත්ව නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘතිය සත්ව සෞඛ්‍ය හා ව්‍යාප්ති සේවා | 5,371,000 | – |
| ශීර්ෂ 56 : සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – සමුපකාර සමිති සංවර්ධන හා පරිපාලනය | 6,568,000 | – |
| ශීර්ෂ 60 : පළාත් පාලන හා සමාජ සුභ සාධන අමාත්‍ය වරයා – | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 3,272,600 | 12,950,000 |
| ශීර්ෂ 61 : පළාත් පාලන දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – පළාත් පාලන සේවා | 36,677,000 | – |
| ශීර්ෂ 62 : සමාජ සේවා දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – මුදල් ආධාර සහ සමාජ සේවා සැපයීම | 61,788,000 | 75,000 |
| වැඩ සටහන 2 – දිළිඳු සහන සේවා සැපයීම | 402,000,000 | – |
| ශීර්ෂ 63 : පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව – | | |
| වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | 305,000 | – |
| වැඩ සටහන 2 – හැඩගැස්වීමේ හා පුනරුත්ථාපන සේවා | 200,000 | – |
| වැඩ සටහන 3 – ළමාරක්ෂක සේවා | 234,000 | – |

| | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| ශීර්ෂ 64 : ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව –<br>වැඩ සටහන 1 – ප්‍රජා සංවර්ධන හා පුහුණුව | 1,580,000 | – |
| ශීර්ෂ 70 : කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා –<br>වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය, කාර්ය මණ්ඩල සේවා | 3,337,880 | 5,000,000 |
| ශීර්ෂ 72 : කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව –<br>වැඩ සටහන 1 – කුඩා කර්මාන්ත අභිවර්ධනය හා උත්තතිය | 1,605,000 | – |
| ශීර්ෂ 80 : පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂම –<br>වැඩ සටහන 1 – සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 951,840 | – |
| එකතුව | 1,422,632,000 | 311,865,030 |

| | | |
|---|---|---|
| පුනරාවර්තන වැය | රු. 1,422,632,000 | (රුපියල් එකසිය හතළිස් දෙකෝටි විසිහය ලක්‍ෂ තිස් දෙදහසකි) |
| ප්‍රාග්ධන වැය | රු. 311,865,030 | (රුපියල් තිස්එක්කෝටි දහඅට ලක්‍ෂ හැටපස් දහස් තිහයි) |
| එකතුව | රු. 1,734,497,030 | (රුපියල් එකසිය හැත්තෑතුන් කෝටි හතළිස් හතර ලක්‍ෂ අනූහත්දාස් තිහයි) |

03-55/4

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 01 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1991 අප්‍රේල් මස 04 වැනි දින.

අනුමැතිය ලැබුණේ : 1991 මැයි මස 07 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස්. ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 01 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

*1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 1991 අංක 01 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ 2 (1) වන වගන්තියෙහි දක්වා ඇති " 1991 ජනවාරි 01 වැනි දිනෙන් ආරම්භව 1991 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි, තක්සේරු කර ඇති රුපියල් එකසිය විසිපන්කෝටි අනූපන්ලක්‍ෂ හැටහත්දහසක් වූ සබරගමුව පළාත් සභාවේ වියදම" යන්න ඉවත් කොට, ඒ වෙනුවට "1991 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 1991 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි, තක්සේරු කර ඇති රුපියල් එකසිය විසිපන් කෝටි අනූලක්‍ෂ අසූපන්දහසක් වූ සබරගමු පළාත් සභාවේ වියදම" යන්න ආදේශනය කරනු ලැබේ.

එමෙන්ම 2 (1) (ආ) යටතේ දැක්වෙන "රුපියල් එකසිය විසිපන්කෝටි අසූපන් ලක්‍ෂ හැටහත්දහසක්" යන්න ඉවත් කොට, ඒ වෙනුවට "රුපියල් එකසිය විසිපන්කෝටි අනූලක්‍ෂ අසූපන්දහසක්" යන්න ආදේශ කරනු ලැබේ.

03. 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ පළමු වන උප ලේඛණය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

පුනරාවර්තන වියදම් "1,09,75,67,000" වෙනුවට "1,09,79,67,000" ආදේශ කිරීමෙන් ද,
ප්‍රාග්ධන වියදම් "16,10,00,000" වෙනුවට "16,11,18,000" ආදේශ කිරීමෙන් ද,
පළාත් සභා සභාපති – වැඩ සටහන –පළාත් සභා සේවා – පුනරාවර්තන වියදම් 59,74,320 වෙනුවට 63,74,320 ආදේශ කිරීමෙන් ද,
ප්‍රධාන අමාත්‍ය තුමා – වැඩ සටහන 2 – ප්‍රධාන අමාත්‍යාංශ කටයුතු මගින් බලතල ක්‍රියාවේ යෙදවීම – ප්‍රාග්ධන වියදම් ·
"5,17,50,000" වෙනුවට "5,18,68,000" ආදේශ කිරීමෙන් ද,

04. 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ 08 වන වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර එම ප්‍රඥප්තියේ 02 වන උපලේඛනයෙහි අවසාන තීරුවට අනතුරුව පහත දැක්වෙන තීරය එකතු කරනු ලැබේ :-

| | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| ශීර්ෂ 64 : ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව - වැඩ සටහන 1 - ප්‍රජා සංවර්ධන හා පුහුණුව | 1,580,000 | - |
| ශීර්ෂ 70 : කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා - වැඩ සටහන 1 - සාමාන්‍ය පරිපාලනය, කාර්ය මණ්ඩල සේවා | 3,337,880 | 5,000,000 |
| ශීර්ෂ 72 : කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව - වැඩ සටහන 1 - කුඩා කර්මාන්ත අභිවර්ධනය හා උන්නතිය | 1,605,000 | - |
| ශීර්ෂ 80 : පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂම - වැඩ සටහන 1 - සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 951,840 | - |
| එකතුව | 1,422,632,000 | 311,865,030 |

| | | |
|---|---|---|
| පුනරාවර්තන වැය | රු. 1,422,632,000 | (රුපියල් එකසිය හතළිස් දෙකෝටි විසිහය ලක්ෂ තිස් දෙදහසකි) |
| ප්‍රාග්ධන වැය | රු. 311,865,030 | (රුපියල් තිස්එක්කෝටි දහඅට ලක්ෂ හැටපන් දහස් තිහයි) |
| එකතුව | රු. 1,734,497,030 | (රුපියල් එකසිය හැත්තෑතුන් කෝටි හතළිස් හතර ලක්ෂ අනූහත්දාස් තිහයි) |

03-55/4

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 01 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1991 අප්‍රේල් මස 04 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1991 මැයි මස 07 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස්. ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 01 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

*1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 1991 අංක 01 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ 2 (1) වන වගන්තියෙහි දක්වා ඇති " 1991 ජනවාරි 01 වැනි දිනෙන් ආරම්භව 1991 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි, තක්සේරු කර ඇති රුපියල් එකසිය විසිපන්කෝටි අනූපන්ලක්ෂ හැටහත්දහසක් වූ සබරගමුව පළාත් සභාවේ වියදම" යන්න ඉවත් කොට, ඒ වෙනුවට "1991 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 1991 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි, තක්සේරු කර ඇති රුපියල් එකසිය විසිපන් කෝටි අනූලක්ෂ අසූපන්දහසක් වූ සබරගමු පළාත් සභාවේ වියදම" යන්න ආදේශනය කරනු ලැබේ.

එමෙන්ම 2 (1) (ආ) යටතේ දැක්වෙන "රුපියල් එකසිය විසිපන්කෝටි අසූපන් ලක්ෂ හැටහත්දහසක්" යන්න ඉවත් කොට, ඒ වෙනුවට "රුපියල් එකසිය විසිපන්කෝටි අනූලක්ෂ අසූපන්දහසක්" යන්න ආදේශ කරනු ලැබේ.

03. 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ පළමු වන උප ලේඛණය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

පුනරාවර්තන වියදම් "1,09,75,67,000" වෙනුවට "1,09,79,67,000" ආදේශ කිරීමෙන් ද,
ප්‍රාග්ධන වියදම් "16,10,00,000" වෙනුවට "16,11,18,000" ආදේශ කිරීමෙන් ද,
පළාත් සභා සභාපති - වැඩ සටහන -පළාත් සභා සේවා - පුනරාවර්තන වියදම් 59,74,320 වෙනුවට 63,74,320 ආදේශ කිරීමෙන් ද,
ප්‍රධාන අමාත්‍ය තුමා - වැඩ සටහන 2 - ප්‍රධාන අමාත්‍යාංශ කටයුතු මගින් බලතල ක්‍රියාවේ යෙදවීම - ප්‍රාග්ධන වියදම් "5,17,50,000" වෙනුවට "5,18,68,000" ආදේශ කිරීමෙන් ද,

04. 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ 08 වන වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර එම ප්‍රඥප්තියේ 02 වන උපලේඛනයෙහි අවසාන තීරුවට අනතුරුව පහත දැක්වෙන තීරය එකතු කරනු ලැබේ :-

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 |
|---|---|---|---|---|---|---|
| කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය | 0017 | පේශකර්මාන්ත වැඩ පලවල් පිහිටුවීම හා පරිපාලනය | 2,00,00,000 | 50,00,000 | 17,50,000 | 1,82,50,000 |

03–55/5

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 05 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1991 ඔක්තෝබර් මස 03 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1991 නොවැම්බර් මස 27 වැනි දින

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදියි,

ඇස්. ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි

සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය 1991 අංක 05 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක හෝ දිනයන් සි සිට එහි විධිවිධාන ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :–

උසාවි දඩ

"99 (1) යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන යම් බද්දක්, ගාස්තුවක් හෝ වෙනත් අය බද්දක් අය කර ගැනීමට අදාලව පනවනු ලබන්නා වූ දඩ හැර, අධිකරණයක් විසින් පළාත තුළ අධිකරණ බලය පාවිච්චි කරමින්, පනවනු ලැබ, අධිකරණයට ගෙවනු ලබන්නා වූ වරදවල්වලට අදාල සියළුම දඩ මුදල්, යම් ලිඛිත නීතියක විධිවිධාන අනුව, එබඳු දඩයකින් කරනු ලබන යම් ගෙවීමක් සම්බන්ධව අධිකරණයකින් කරනු ලබන යම් නියමයකට යටත් ව එම පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

උසාවි ගාස්තු

99 (2) අධිකරණයක් විසින් පළාත තුළ අධිකරණ බලය පාවිච්චි කරමින් අයකර ගනු ලබන්නා වූ සියළුම අධිකරණ ගාස්තු එම පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය."

03–55/9

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1990 අංක 07 දරන සබරගමුව ස්වයං රැකියා පදනම ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1990 සැප්තැම්බර් මස 28 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1990 නොවැම්බර් 07 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස් ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 |
|---|---|---|---|---|---|---|
| කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය | 0017 | පේෂකර්මාන්ත වැඩ පලවල් පිහිටුවීම හා පරිපාලනය | 2,00,00,000 | 50,00,000 | 17,50,000 | 1,82,50,000 |

03–55/5

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1991 අංක 05 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ ; 1991 ඔක්තෝබර් මස 03 වැනි දින.

අනුමැතිය ලැබුනේ ; 1991 නොවැම්බර් මස 27 වැනි දින

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදියි,

ඇස්. ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි

සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය 1991 අංක 05 දරන සබරගමුව පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක හෝ දිනයන් හි සිට එහි විධිවිධාන ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :–

උසාවි දඩ

"99 (1) යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන යම් බද්දක්, ගාස්තුවක් හෝ වෙනත් අය බද්දක් අය කර ගැනීමට අදාලව පනවනු ලබන්නා වූ දඩ හැර, අධිකරණයක් විසින් පළාත තුළ අධිකරණ බලය පාවිච්චි කරමින්, පනවනු ලැබ, අධිකරණයට ගෙවනු ලබන්නා වූ වරදවල්වලට අදාල සියළුම දඩ මුදල්, යම් ලිඛිත නීතියක විධිවිධාන අනුව, එබඳු දඩයකින් කරනු ලබන යම් ගෙවීමක් සම්බන්ධව අධිකරණයකින් කරනු ලබන යම් නියමයකට යටත් ව එම පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

උසාවි ගාස්තු

99 (2) අධිකරණයක් විසින් පළාත තුළ අධිකරණ බලය පාවිච්චි කරමින් අයකර ගනු ලබන්නා වූ සියළුම අධිකරණ ගාස්තු එම පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය."

03–55/9

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1990 අංක 07 දරන සබරගමුව ස්වයං රැකියා පදනම ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ ; 1990 සැප්තැම්බර් මස 28 වැනි දින.

අනුමැතිය ලැබුනේ ; 1990 නොවැම්බර් 07 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ඇස් ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

## සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන සබරගමුව ස්වයං රැකියා පදනම ප්‍රඥප්තිය

*සබරගමුව පළාත තුළ රැකියා අවස්ථාවන් ජනනය කිරීම, ස්වයං රැකියා සඳහා මූල්‍ය, ද්‍රව්‍යමය හා තාක්ෂණික ආධාර හා සාත්‍ය බල සම්පාදනය, වෘත්තීය හා ශිල්පීය පුහුණුව ජනතාවට ලබාදීම අරමුණු කොටගත් සබරගමු රැකියා පදනමක් සංස්ථාපනය කිරීම හා ඊට අදාළ හෝ ආනුෂංගික විධි විධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන ස්වයං රැකියා පදනම ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේය. — කෙටි නාමය හා ක්‍රියාත්මකවන දිනය.

*I වැනි කොටස*

### සබරගමුව රැකියා පදනම

2. (1) මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන කරනු ලබන "සබරගමුව රැකියා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවනු ලැබේ. — සබරගමුව රැකියා පදනම පිහිටුවීම.

(2) (1) වන උප වගන්තියෙන් පදනමට දී ඇති නාමයෙන් ඒ පදනම අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම නාමයෙන් පදනම විසින් නඩු පැවරීම ද, පදනමට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

3. (1) මෙහි මින්මතු පාලක මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන සබරගමුව රැකියා පදනමෙහි පාලක මණ්ඩලයක් සංස්ථාපනය කරනු ලැබේ. — පදනමෙහි පාලක මණ්ඩලය.

(2) සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් (3) වැනි අනුඡේදයේ විධි විධානවලට යටත්ව පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා සාමාජිකයන් හත් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් පාලක මණ්ඩලය සමන්විත විය යුතුය.

(3) පහත සඳහන් අය නිල බලයෙන් පාලක මණ්ඩලයෙහි සාමාජිකයන් විය යුතුය :—

(අ) ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් ;

(ආ) කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ;

(ඇ) කර්මාන්ත, ප්‍රවාහන හා වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් ;

(4) පාලක මණ්ඩලයෙහි සෙසු සාමාජිකයන් පහත සඳහන් පරිදි පත් කළ යුතුය :—

(අ) සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරන සමුපකාර සමිති නියෝජිතයන් දෙදෙනෙකු ;

(ආ) ප්‍රධාන ලේකම්වරයාගේ නියෝජිතයෙකු වශයෙන් ගණකාධිකාරිවරයෙක් ;

(ඇ) සබරගමු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් ;

(ඈ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි පත්කරනු ලබන රජයේ සේවකයෙකු නොවන අයෙකු.

(5) ඉහත 4 වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙක්ම, ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් හෝ පදවියෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ තනතුරු දැරීම අවසන් වූවහොත් හැරෙන්නට ඔහු පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් එම නිලය දරනු ඇත.

(6) ඉහත 4 වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ ඕනෑම සාමාජිකයකුට ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිපියක් ඉදිරිපත් කර ඕනෑම අවස්ථාවක දී මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකිය.

(7) ඉහත 4 වන අනුච්ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකුගේ, පත්වීම ප්‍රධාන අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි අතර, එසේ කිරීම කිසිදු අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් හෝ ඉදිරියේ අභියාචනයක්, ආඥාවක් නැතහොත් මොනයම් ආකාරයකින් හෝ ප්‍රශ්න නොකළ යුතුය.

(8) ඉල්ලා අස්වීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් හෝ ඉවත්වන්නා වූ සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබිය හැකිය.

(9) ධුරය දැරීම අහෝසිවීමෙන් පුරප්පාඩු වූ යම් ධුරයකට පත් කරනු ලැබූ අනුප්‍රාප්තිකයකු ධුරය දරනු ලැබිය යුත්තේ පූර්වගාමියාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා ය.

4. (1) සභාපතිවරයා පාලක මණ්ඩලයේ සියළු රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටිය හොත්, පැමිණ සිටින සාමාජිකයින් විසින්, තමන් අතුරෙන් නවර හෝ සාමාජිකයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතුය. — පාලක මණ්ඩලයේ කාර්ය පරිපාටිය

(2) පාලක මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරනය සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, පාලක මණ්ඩලය විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් සිය කාර්යය විධානය විධිමත් කර ගත හැකිය.

(3) පාලක මණ්ඩලය පදනමේ කටයුතු පාලනය කළ යුතු අතර, බලතල හා වගකීම් ක්‍රියාත්මක කිරීම ද කළ යුතුය.

(4) (අ) පාලක මණ්ඩලයට තම බලතල හා වගකීම් සභාපතිට, කමිටු සාමාජිකයෙකුට හෝ සේවකයෙකුට පැවරිය හැකි ය.

(ආ) එසේ බලතල හෝ වගකීම් පවරනු ලැබූ සෑම පුද්ගලයෙක්ම එම බලතල හෝ වගකීම් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම, පාලක මණ්ඩලයේ විශේෂ හෝ සාමාන්‍ය විධි විධානයන්ට යටත්ව කළ යුතුය.

(5) පාලක මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණයක් ගැනීමට ඇති සියළු කරුණු පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය. පක්ෂව හා විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක සභාපතිවරයාට හෝ මුලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතුයි.

(6) පාලක මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයෙකු පත් කිරීමෙහි ලා කිසියම් දෝෂයක් තිබීමේ හෝ හේතුවෙන් පමණක් බල රහිත නොවිය යුතුය.

(7) පාලක මණ්ඩලයට ලේකම්වරයෙකු සිටිය යුතුය. කමිටුවේ සාමාජිකයින් අතුරින් එක් අයෙකු ලේකම්වරයෙකු ලෙස පත්කරනු ලැබිය යුතුය.

(8) පදනමෙහි මුද්‍රාව ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර, පාලක මණ්ඩලයේ තීරණය පරිදි මුද්‍රාව භාවිතා කළ යුතුය.

## *II* වැනි කොටස

### සබරගමුව රැකියා පදනමේ පාලක මණ්ඩලයේ බලතල

පාලක මණ්ඩලයේ බලතල

5. (1) සබරගමුව රැකියා පදනමේ මුදල් නිශ්චය කාර්ය සඳහා හවුභාගත් ණය ලාභීන් හෝ ව්‍යවසායකයින් වෙත ගෙන යාමට සුදුසු ආයතන තීරණය කිරීම.

(2) පදනමින් මුදල් ආයෝජන සාර ආරම්භ කළ හැකි ව්‍යාපෘතීන් තීරණය කිරීම.

(3) සබරගමුව පළාත් අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ අනුව, ආයෝජනය කරනු ලබන මුදල් සඳහා පොලී ප්‍රතිශත තීරණය කිරීම හා එම පොලී ප්‍රතිශතයෙන් පාලක මණ්ඩලය තීරණය කරන ප්‍රමාණයක් සේවා ගාස්තු වශයෙන් I වන අනුච්ඡේදය මගින් තීරණය කරන ලද ආයතන වලට ගෙවීම.

(4) පදනමේ බැංකු ගිණුමක් අනුමත බැංකුවක පවත්වාගෙන යාම හා තැන්පත් ගිණුම් අවශ්‍ය පරිදි විවෘත කිරීමේ බලය.

(5) පදනමේ අරමුදලට ලැබෙන පොලිය මෙම පදනමේ පාලක හා ප්‍රචාරක කටයුතු සඳහා සහ අරමුදලේ කටයුතු සඳහා වියදම් දැරීම.

(6) පදනමේ අරමුදලේ භාරකාරීත්වය.

(7) පදනමේ අරමුදල් ආයෝජනය පිළිබඳව නීති රීති සකස්කර ගැනීම පාලක මණ්ඩලය විසින් කළ යුතු අතර, එවැනි නීති රීති ක්‍රියාත්මක කිරීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

(8) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටුකිරීම පිණිස ගිවිසුම් වලට බැඳීම හා වෙනත් අන්දමේ අවශ්‍ය කාර්යයන් කිරීම.

(9) ණයලාභීන්ට අවශ්‍ය කළමනාකාරීත්ව ශිල්පීය අලෙවි අංශවල පුහුණු පාඨමාලා පැවැත්වීම, තොරතුරු හා සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

6. පදනම සඳහා වෙනම අරමුදලක් තිබිය යුතු අතර, පහත සඳහන් ලැබීම් අරමුදලේ ආදායම වන්නේ ය :–

(1) පදනමෙහි අරමුණු ඉටු කිරීම සඳහා සබරගමුව පළාත් සභාව විසින් දෙනු ලබන ප්‍රදානයන් ;
(2) පුද්ගලයින් හෝ මහජන සංවිධාන විසින් කරනු ලබන පරිත්‍යාග ;
(3) ශ්‍රී ලංකාවේ රජය හෝ විදේශීය රාජ්‍ය ආයතන වලින් යැවෙන ප්‍රදානයන් ;
(4) පදනම විසින් සේවා සැපයීම වෙනුවෙන් අයකළ යුතුද යයි තීරණය කරන ගාස්තු, පොලී හා ලාභාංශ.

### ගිණුම් කාර්ය පරිපාටිය

7. (1) ප්‍රධාන ලේකම්වරයා විසින් උපදෙස් දෙනු ලබන ආකාරයට පාලක මණ්ඩලය විසින් අරමුදල් පිළිබඳ ගිණුම් තබා ගැනීම කළ යුතුය.

(2) පාලක මණ්ඩලයේ සභාපතිවරයා විසින් අර්ධ වාර්ෂිකව පදනමේ අරමුදල් ආයෝජනය පිළිබඳ ප්‍රගතිය අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතුය.

(3) පදනමේ මුදල් වර්ෂය ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භව දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

(4) අරමුදල් ගිණුම් සුදුසුකම් ලත් විගණක වරයෙකු ලවා විගණනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී විගණකවරයා ආදායම් සහ වියදම්, වියදම් වාර්තාවක් සමග පසුගිය අවුරුද්ද තුළ අරමුදලේ කාර්යයන් පරිපාලනය කිරීම ගැන වාර්තාවක් පිළියෙල කළ යුතුය.

(5) මණ්ඩල විගණක වරයාගේ වාර්තාව ලැබුණු පසු ප්‍රායෝගික වශයෙන් කළ හැකි වහාම පසුගිය වසරේ අරමුදලේ ක්‍රියාවන් පරිපාලනය පිළිබඳ තම වාර්තාව, විගණක වරයාගේ වාර්තාව සමග ප්‍රධාන අමාත්‍ය වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රධාන අමාත්‍යවරයා එම වාර්තාව පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(6) මෙම වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යනුවෙන් අදහස් වන්නේ–

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලැබූ වෙනත් ආයතනයක සාමාජිකයෙකු වූ ද, ඒ ආයතනයේ සභාව විසින් ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල් කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටු වන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයෙකු වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

8. (1) පදනමට ස්වකීය කටයුතු කරගෙනයාම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයින් අමාත්‍ය මණ්ඩල හෝ එකඟත්වය මත බඳවාගත හැකියි.

(2) එකී සියලුම සේවකයන් දණ්ඩනීති සංග්‍රහය හෝ විධි විධාන අනුව, රාජ්‍ය නිලධරයන් හෝ සලකනු ලැබිය යුතු අතර, පදනම අල්ලස් පනතේ විධි විධාන අනුව උපලේඛන ගත ආයතනයන් හෝ සලකනු ලැබිය යුතුයි.

(3) පදනමට බඳවාගන්නා වූ සේවකයන්ගේ හා නිලධරයන්ගේ වැටුප් හා දීමනා පළාත් සභා පනතේ විධි විධාන අනුව පළාත් සභා අරමුදලට වැය බරක් විය යුත්තෝයි.

9. (1) පදනමට අදාල කරුණු පිළිඳව ප්‍රධාන අමාත්‍යවරයාට රීති සෑදිය හැකි අතර, එසේ සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය මත අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියෙහි තැබිය යුතුයි.

(2) 1 වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් අනුමැතිය දුන් දින සිට එබඳු රීති ක්‍රියාත්මක වන්නේ යි.

10. මෙම ප්‍රඥප්තියෙහි, අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් හැරෙන්නට– අර්ථ නිරූපනය

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා ද ;
"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ද ;
"අනුමත බැංකුව" යන්නෙන් ලංකා බැකුව හා මහජන බැංකුව අදහස් කෙරේ.

03–55/1

---

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1990 දෙසැම්බර් මස 06 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1990 දෙසැම්බර් මස 28 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි

ඇස්. ඩී. පියදාස,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් සභාවේ 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය

*1991 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

04. තවද, 1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ පුනරාවර්තන වියදම් තීරුව පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. එකී උපලේඛනයෙහි -

(i) ශීර්ෂ 31 : ප්‍රතිපත්ති සැළසුම් සම්පාදනය " 2,846,000" වෙනුවට " 2,908,000" ආදේශ කිරීමෙන් ද,

(ii) ශීර්ෂ 33 : ප්‍රාදේශීය පරිපාලනය " 59,240,000" වෙනුවට " 81,777,600" ආදේශ කිරීමෙන් ද,

(iii) ශීර්ෂ 41 : අධ්‍යාපන දෙපාර්තමේන්තුව " 595,700,000" වෙනුවට " 631,700,000" ආදේශ කිරීමෙන් ද,

(iv) ශීර්ෂ 43 : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැඩ සටහන - 1 " 43,605,824" වෙනුවට " 53,265,824" ආදේශ කිරීමෙන් ද,

(v) ශීර්ෂ 44 : ආයුර්වේද දෙපාර්තමේන්තුව " 11,320,000" වෙනුවට " 12,070,000" ආදේශ කිරීමෙන් ද,

(vi) ශීර්ෂ 51 : ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව " 3,333,000" වෙනුවට " 3,533,000" ආදේශ කිරීමෙන් ද,

(vii) ශීර්ෂ 52 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව " 9,650,000" වෙනුවට " 9,812,000" ආදේශ කිරීමෙන් ද,

(viii) ශීර්ෂ 54 : ගොවිජන සේවා දෙපාර්තමේන්තුව - වැඩ සටහන - 1 " 1,974,520" වෙනුවට " 2,374,520" ආදේශ කිරීමෙන් ද,

(ix) ශීර්ෂ 55 : සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව " 5,420,000" වෙනුවට " 6,420,000" ආදේශ කිරීමෙන් ද,

(x) ශීර්ෂ 56 : සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව " 6,620,000" වෙනුවට " 7,370,000" ආදේශ කිරීමෙන් ද,

(xi) ශීර්ෂ 61 : පළාත් පාලන දෙපාර්තමේන්තුව " 36,900,000" වෙනුවට " 37,020,000" ආදේශ කිරීමෙන් ද,

(xii) ශීර්ෂ 62 : සමාජ සේවා දෙපාර්තමේන්තුව - වැඩ සටහන - 1 " 2,553,080" වෙනුවට " 2,585,880" ආදේශ කිරීමෙන් ද,

(xiii) ශීර්ෂ 63 : පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව " 746,000" වෙනුවට " 1,113,600" ආදේශ කිරීමෙන් ද,

(xiv) ශීර්ෂ 64 : ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව " 1,590,000" වෙනුවට " 1,806,000" ආදේශ කිරීමෙන් ද,

(xv) ශීර්ෂ 71 : කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව " 1,616,000" වෙනුවට " 1,803,200" ආදේශ කිරීමෙන් ද,

(xvi) ශීර්ෂ 72 : රේෂකම් හා ග්‍රාමීය කර්මාන්ත " 13,460,000" වෙනුවට " 14,460,000" ආදේශ කිරීමෙන් ද,

සංශෝධනය කෙරේ.

03-60/1

---

යොමු අංකය : කවෙ/5.

සබරගමුව පළාත් සභාව

බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

මෙහි පහත පළ කරන ලද බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය මෙම ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට දින දහයක් ඉකුත් වීමෙන් පසු සබරගමුව පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු ඇත්නම් ඒවා එම දින දහයේ කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ යුතුවේ.

එච්. ආර්. ජයතිලක පොඩිනිලමේ,
කර්මාන්ත, ප්‍රවාහන හා වෙළඳ අමාත්‍ය.

1992 පෙබරවාරි මස 05 වැනි දින,
සබරගමුව පළාත් සභාව,
රත්නපුර.

සබරගමුව පළාත් සභාව

*බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීමේ 1992 අංක................. දරන ප්‍රඥප්තියයි*

සබරගමුව පළාත ඇතුළත ආරම්භ වන, බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීම සඳහා සහ ඒ සේවා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවට හැකි කරවීම සඳහාද, 1990 අංක 3 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය අවසන් කිරීමට ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය 1992 අංක.............. දරන සබරගමුව පළාත් සභාවේ ( බස්රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීමේ) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා ගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**ප්‍රඥප්තිය පරිපාලනය කිරීම.**

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් බස්රථ ප්‍රවාහන අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තිය සාමාන්‍යයෙන් පරිපාලනය කිරීම ඔහුට භාර වන්නේය. තවද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පළාත් බස් රථ ප්‍රවාහන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, තත් කාර්යය සඳහා අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිත ලියවිල්ලකින් බලය පවරනු ලැබූ, යම් පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් හෝ වෙනත් නිලධරයකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකිය.

**නිතිපතා සේවා සඳහා මගී වාහන අවසර පත්‍ර.**

3. (1) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ හැර, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව, කිසිම තැනැත්තකු විසින්, මෙහි (2) වන උපවගන්තියට යටත්ව, වෙන් වෙන් ගාස්තු මත, මගීන් ගෙන යාම සඳහා පළාත ඇතුළත ආරම්භ වන නිතිපතා සේවය සඳහා බස් රථ පළාත ඇතුළත යොදා නොගත යුතුය.

(2) පළාත ඇතුළත ආරම්භ වන මාර්ගයක් සම්බන්ධයෙන්, 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධන) පනතින් සංශෝධිත 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත සහ 1990 අංක 03 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර සහ බස් රථ ධාවකයින් විසින් දැනට දරනු ලබන මාර්ග අවසර පත්‍ර මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවකටද, ඒ කාල සීමාව සහ මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට හයමාසයක් වූ කාල සීමාව යන දෙකෙන් අඩුකාල සීමාවක් සඳහා ඒ අවසර පත්‍ර වලංගු වන්නේය.

(3) කිසිම තැනැත්තකු විසින්, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන්පසුව, වෙන් වෙන් ගාස්තු මත, පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ නිතිපතා සේවය සඳහා, බස් රථයක් නොවන් වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

(4) අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ යම් පොලිස් නිලධාරියකු විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් තහනම් කොට තම භාරයට ගත හැකි අතර, ඔහු ඒ වාහනය එසේ තහනම් කොට තම භාරයට ගනු ලැබුවේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව තුළද, ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, ඒ වාහනය ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

(5) යම් වාහනයක් (4) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසාන වනතුරු, ඒ වාහනය රඳවා තබන ආඥාවක් හෝ නඩුවේ කරුණු අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව ඒ වාහනය නිදහස් කරන ආඥාවක් කළ හැකි ය.

**අවසරිත බස්රථ මගින් මගීන් ගෙනයාම.**

4. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන මගී සේවා අවසර පත්‍රයකින් ඒ අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල මගීන් ගෙන යාම සඳහා සේවයක් පවත්වා ගෙන යාම පිණිස, ඒ අවසර පත්‍රය දරන්නා ලියාපදිංචි අයිතිකරු වන බස් රථයක්, යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන්නාට අයිතිවාසිකම ලැබෙන්නේය.

**මගී වාහන අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.**

5. (1) මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියක් අනුව වියයුතු අතර, එය බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්කරුවකුම විසින් (1) වැනි උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රය සමග, පහත දැක්වෙන විස්තර අඩංගු නියමිත ආකෘතිය අනුව වූ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය :–

(අ) වෙන් වෙන් ගාස්තු මත, මගීන් ගෙන යාම සඳහා ඒ බස් රථය යොදා ගැනීමට අදහස් කරනු ලබන මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර.

(ආ) 6 වැනි වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා ඉල්ලා සිටින වෙනත් විස්තර.

**අවසර පත්‍ර සඳහාවූ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම.**

6. මගී සේවා අවසර පත්‍රයක් දීම සම්බන්ධයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීම සම්බන්ධයෙන් සහ අවසර පත්‍ර දෙනු ලැබිය හැක්කේ යම් මාර්ගයක් හෝ මාර්ග සඳහාද, ඒ මාර්ග සම්බන්ධයෙන් තම අභිමතය ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂවරයා විසින්, වෙන් වෙන් ගාස්තු මත, මගීන් ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් අවශ්‍ය කරන තැනැත්තන් සහ ඒ පහසුකම් සලසන තැනැත්තන්ද ඇතුළුව, පොදු මහජනතාවගේ යහපත ගැනත්, විශේෂයෙන්ම, ඒ අභිමතය ක්‍රියාත්මක කිරීමේදී පහත දක්වෙන කරුණු ගැනත් සැලකිල්ල දක්විය යුතුය :–

(අ) පොදු යහපත පිණිස කොතෙක් දුරට යෝජිත පරිදි මගීන් ගෙන යාම අවශ්‍යද, යෝග්‍යද යන වග ;

(ආ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල යෝග්‍යතාව ;

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ ඉන් යම් මාර්ගයක දැනටමත් කොතෙක් දුරට ප්‍රමාණවත් ලෙස, මගීන් ගෙන යාමේ සේවයක් සලසා තිබේද යන වග ;

(ඈ) (ප්‍රමාණවත්, යෝග්‍ය සහ කාර්යක්ෂම සේවාවන් සැපයීමද ඇතුළුව) රථවාහනවලට අදාළව, සමස්තයක් වශයෙන් ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගින් ප්‍රවාහණය කිරීම ඇතුළුව, සියලුම ආකාරයෙන් මගීන් ප්‍රවාහණය කිරීම සම්බන්ධීකරණය කිරීම.

7. (1) යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව හෝ ගාස්තු අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබුවහොත් හැර, අධ්‍යක්ෂවරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට මගී සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය. මගී සේවා අවසර පත්‍ර වලංගු කාලසීමාව.

(2) සෑම මගී වාහන අවසර පත්‍රයක්ම -

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතුය ; තවද,

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් හැර, එය නිකුත් කරන ලද දින සිට මාස දොළහේ සිට මාස තිස්හයක් වූ කාල සීමාවක් වලංගුව පවතින්නේ ය.

8. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව සහ පහසුව සැලසීම පිණිස අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන කොන්දේසි අනුයුක්ත කරනු ලැබිය යුතුය. ඒ කොන්දේසිවලට - අවසර පත්‍රයේ අනුයුක්ත කළයුතු කොන්දේසි.

(අ) අය කරනු ලබන ගමන් ගාස්තු මගී සේවා අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ සඳහන් වන ගාස්තු විය යුතු බවට ;

(ආ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය අවසර පත්‍රයේ සඳහන් වන මාර්ගයෙහි හෝ මාර්ගවල ධාවනය කළයුතු බවට ;

(ඇ) (නියම කර ඇති විට) කාල සටහනෙහි සහ ගමන් ගාස්තු චක්‍රයෙහි පිටපත්, අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රැගෙන යායුතු බවට සහ එහි තුළ ප්‍රදර්ශනය වන ලෙස තැබිය යුතු බවට ;

(ඈ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය සියලු අවස්ථාවන්හිදී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වා ගෙන යායුතු බවට ;

(ඉ) බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව කාර්යයෙහි නිරත වන කාලය සහ ඔවුන්ගේ වැඩ කරන සහ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක නියමයන් අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රියදුරු සහ කොන්දොස්තර සම්බන්ධයෙන් පිළිපදිනු ලැබිය යුතු බවට

නියම කෙරෙන කොන්දේසිද ඇතුළත් කළ හැකි ය.

9. අධ්‍යක්ෂ විසින්, මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් දෙනු ලබන අවස්ථාවේ ද, යොදා ගැනීම පිණිස ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලබන බස් රථය, එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි බලය ලත් තැනැත්තා සලකන වෙනත් විස්තර, ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන්, නිශ්චිත වශයෙන් ඒ අවසර පත්‍රයේ දක්වනු ලැබිය යුතුය නිශ්චිත වශයෙන් දක්වීම.

10. මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ ඕනෑම තැනැත්තකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන පිළිපදින බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා අදහස් කරන විධාන ඒ තැනැත්තාට නිකුත් කළ හැකි අතර, ඒ විධාන නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින් ඒ විධානවල සඳහන් වන කාලය ඇතුළත, ඒ විධාන පිළිපැදිය යුතුය. විධාන නිකුත් කිරීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.

11. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බල රහිත වන්නේ ය. අවසර පත්‍ර පැවරිය නොහැකි බව.

12. මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසර පත්‍රය දරන්නා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදුවූ දින සිට දින තිහක් ඇතුළත, ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඒ පිළිබඳව ලියවිල්ලකින් අධ්‍යක්ෂවරයාට දැනුම් දී, ඔහුගේ එකඟත්වය ලියවිල්ලකින් ලබා ගත යුතුය. අවසර පත්‍ර දරන්නන් විසින් විස්තරවල යම් වෙනසක් පිළිබඳව අධ්‍යක්ෂවරයාට දන්විය යුතු බව.

13. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට - අවසර පත්‍රය අලුත් කිරීම.

(අ) ඒ මගී සේවා අවසර පත්‍රය දරන්නා මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කර ඇති බවට හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ යම් වරදක් කර නොමැති බවට ; සහ

(ආ) මගී සේවා අවසර පත්‍රය දරන්නා අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවන බවට

අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා ඒ අවසර පත්‍රය අලුත් කළ හැකිය.

අවසර පත්‍රයක් අවලංගු කිරීම.

14. (1) මගී වාහන අවසර පත්‍රයක් දරන්නා -

(අ) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් හෝ උල්ලංඝනය කර ඇති බවට ;

(ආ) 10 වැනි වගන්තිය යටතේ ඔහුට නිකුත් කර ඇති යම් විධානයක් පිළිපැද නොමැති බවට ; හෝ

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරුවල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඔහු දනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර සපයා ඇති බවට

අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් අධ්‍යක්ෂවරයා විසින් ඒ මගී වාහන අවසර පත්‍රය අවලංගු කළ හැකි ය.

(2) අධ්‍යක්ෂවරයාගේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීමේ කාලය ඉකුත් වන තුරු හෝ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාර අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ අභියාචනය පිළිබඳව සුදුස්සක් කරනු ලබන තුරු, (1) වැනි උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවන්නේය.

අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය සහ එයට හේතු, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට දැනුම් දිය යුතු බව.

15. අධ්‍යක්ෂවරයා විසින් මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය සහ එයට හේතු, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට දැනුම් දිය යුතුය.

අභියාචනය.

16. (1) (අ) මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ

(ආ) අවසර පත්‍රය අවලංගු කරමින්

අධ්‍යක්ෂවරයා විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ ඉල්ලුම්කරු හෝ මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින්, තමාට ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) මෙහි (1) වැනි උපවගන්තිය යටතේ යම් අභියාචනයක් ඉදිරිපත් කරන ලද විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් -

(අ) අභියාචනයට ඉඩ දී, අවසර පත්‍රය දෙන ලෙස හෝ අලුත් කරන ලෙස අධ්‍යක්ෂවරයාට විධාන කිරීම ; හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම

කරනු ලැබිය හැකි ය.

(3) මෙහි (2) වැනි උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ ඕනෑම විධානයක් අධ්‍යක්ෂවරයා විසින් පිළිපැදිය යුතුය.

සහතිකය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව.

17. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම මගී සේවා සහතිකයක්ම, ඒ සහතිකය නිකුත් කරනු ලැබුවේ යම් බස් රථයක් සම්බන්ධයෙන් ද, ඒ බස් රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රකටව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතුය.

18. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සඳහා, අධ්‍යක්ෂකට අවශ්‍ය වන යම්වාර වාර්තාවක්, තොරතුරක් හෝ කරුණු පැහැදිලි කිරීම් දැන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඇතුළත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් දරන්නකුට බලයලත් තැනැත්තා විසින් ලියවිල්ලකින් දැන්වීමක් දිය හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේ ය.

බස් රථ සඳහා පොදු බස් නැවතුම් පලවල්.

19. බස් රථ නැවැත්වීම සඳහා පළාත් සභාවේ ගමනාගමන අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව පළාත් පාලන ආයතන විසින් ප්‍රදේශය තුළ පොදු බස් නැවතුම් පලවල් සහ බස් නවත්වන ස්ථාන එකක් හෝ වැඩි ගණනක් සැපයිය හැකිය.

නියෝග.

20. (1) නියමිත කරුණු ලෙස මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) විශේෂයෙන්ම සහ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග

34

සඳහා ලැබිය හැකිය :–

(අ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රැගෙන යා යුතු පුවරු සහ සළකුණු ;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රියැදුරු හෝ කොන්දොස්තර විසින් රැගෙන යා යුතු ලේඛන සහ ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර ;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක්, එසේ යොදා ගන්නා යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්, සහ ඒ සම්මතයන් උල්ලංඝනය වන ක්‍රියා සහ අකෘතයන් තහනම් කිරීම ;

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල ගමන් සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා ;

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍ර දරන්නන් විසින් ඒ අවසර පත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන සහ අවසාන කරන වේලාවන් සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබා ගත යුතු වාර්තා ;

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ තබා ගනු ලබන වාර්තා සුරැකිව තබා ගැනීම, නියෝගවල සඳහන් යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා ඒ බලධරයා විසින් ඉල්ලා සිටින ලදවිට, ඒ වාර්තා එසේ පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කිරීම ;

(උ) ප්‍රාදේශීය සංගම්, දිස්ත්‍රික් සංගම්වල සහ ඒකාබද්ධ මහා සංගම්වල සහ වෙනත් යම් සංගම්වල කටයුතු පවත්වා ගෙන යාමේ ක්‍රියා පරිපාටිය සහ ඒවායේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ ක්‍රියා පටිපාටිය ;

(ඌ) විශේෂයෙන්ම බස් ධාවන වේලාවන් සංවිධානය කිරීම, වේලාවල් තැබීම, සහ පහසුකම් තිසි පරිදි සහ සාධාරණ ලෙස යෙදවීම සඳහා බස් නැවතුම් පලවල්, බස් නවත්වන ස්ථාන සංවිධාන කිරීම හා කළමනාකරණය කිරීම ;

(එ) කොන්දොස්තරවරුන්ට බලපත්‍ර දීම.

(3) මෙහි (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) මෙහි (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව ; එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය.

21. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් හෝ තමා දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර ඇතුලත් යම්වාර වාර්තාවක්, ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නේය. වරදවල්.

22. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය. දණ්ඩන.

23. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක – පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත් වන බව.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකුව, සමාත්‍යාධිකාරවරයෙකුව, ලේකම්වරයකුව, හෝ ඊට සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩල ව්‍යාපාර ආයතනයක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකු ම

වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියලු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළබව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු

ලැබිය යුතු ය.

24. 1990 අංක 03 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

25. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඊට, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටුකිරීම සඳහා යම් නීතියක් යටතේ ඇති කොට, පිහිටුවනු ලැබූ යම් අධිකාරයක් ද ඇතුළත් වේ ;

" බස් රථය " යන්නෙහි , 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

" මගී " යන්නෙහි, මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය ;

" නියමිත " යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

" අමාත්‍යවරයා " යන්නෙන්, පළාත් සභාවේ ගමනාගමනය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

" වෙන් වෙන් ගාස්තු " යන්නෙහි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

03-62

---

## සුසාන භූමි හා භූමදාන ආඥාපනත (231 වැනි අධිකාරය)

### 5 වැනි වගන්තිය යටතේ වූ නියමය

(231 වැනි අධිකාරය වන ) සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 05 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, සහ නීතිය හා සාමය, පළාත් හා ප්‍රාදේශීය පරිපාලනය, මුදල් හා ක්‍රම සම්පාදනය, සෞඛ්‍ය, ඉඩම් හා පළාත් පාලන කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමය.

ඒ. සී. පී. වීරසූරිය,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, පළාත් හා ප්‍රාදේශීය පරිපාලනය, මුදල් හා ක්‍රම සම්පාදනය, සෞඛ්‍ය, ඉඩම් හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍ය ලේකම්.

1991 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

### නියමය

(1) මෙහි වූ ' ආ ' උපලේඛනයෙහි නිශ්චිත ලෙස නිරූපනය කර ඇති සීමා තුළ මළවුන් භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම පිණිස මෙහි වූ ' අ ' උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමේ පොදු සුසාන භූමියක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) මේ නියමයේ පළමුවැනි ඡේදය යටතේ පිහිටුවනු ලබන පොදු සුසාන භූමිය, සුසාන භූමි සහ භූමදාන ආඥාපනතේ 10,15,16, හා 23 වැනි වගන්තිවල බලපෑමෙන් සම්පූර්ණයෙන් නිදහස් විය යුතුය.

### 'අ' උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාශයේ (පල්ලේපත්තුව), පිටිපන උතුර පිහිටි, බලයලත් මිනින්දෝරු එය. වික්‍රමසිංහ මහතා විසින් සාදන ලද අංක 2734 දරන පිඹුරේ පෙන්නුම් කරන කහටගහලන්ද නැමැති ඉඩමේ ප්‍රමාණයෙන් රූඩ් 03 පර්. 20ක් වන පහත සඳහන් පරිදි මායිම් වූ කහටගහලන්ද නැමැති ඉඩම :-

උතුරට : පාසැල් පටුමග, ලොට් අංක 26,25, හා 24 ;
නැගෙනහිරට : ලොට් අංක 8,9,26,27, සහ 42 ;
දකුණට : කුඹුර ;
බස්නාහිරට : කේ. ඒ. එන්. විමලසේන මහතාගේ ඉඩම.

### 'ආ' උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභාවේ හෝමාගම ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාශයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි සියලු ගම්වලින් සමන්විත ප්‍රදේශය.

03-132